# ශ්‍රී ලංකාවේ වීදි නාට්‍යයේ පියා ලෙස සැලකෙන ආචාර්ය ජී.කේ. හත්තොටුවේගම ගුරු පියාණන් අභාවප්‍රාප්ත වී වසර පහක් පිරීම නිමිත්තෙනි.




විදිය සොඳුරු වේදිකාවක් කළ ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය මූලාරම්භක ආචාර්ය ගාමිණී කල්‍යාණදර්ශ හත්තෙට්ටුවේගම ගුරු පියාණන් අභාවප්‍රාප්ත වී වසර පහක් පිරිම නිමිත්තෙන් (උපත 29-11-1938 විපත : 30-20-2009) විදි නාට්‍ය ආරම්භ සාමාජික කැළණිය විශ්ව විද්‍යාල ආදි විද්‍යාර්ථී ( 1965-1970) විශ්‍රාමික අබේසේකර මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරෙනි. සාකච්ඡාව මෙහෙය වීම සකුන්තලා සෙනෙවිරත්න ආදි විද්‍යාර්ථ කැලණිය සරසවිය. 1975-79

**වීදි නාට්‍ය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?**
විදියේ රඟ දක්වන නාට්‍ය අංගයන්, මෙහි තිර රචනයක් ඇති හා නැතිවශයෙන් දෙවර්ගයක් ඇත. කලින් සුදානම් කරගත් නාට්‍යයක් පළමු වර්ගයටද, අවස්ථාවට උචිත ඒ වේලාවේම සකස්කරගත් නාට්‍ය දෙවෙනි කොටසට අයත් වෙනවා.

**වීදි නාට්‍යයේ ඉතිහාසය දැක්වූවහොත්**
නාට්‍ය ඉතිහාසය බුද්ධ කාලය කරා දිවෙන බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙනවා. ගොතික් නාට්‍ය සම්ප්‍රාදයන්ද ඊට සමකාලීනයි. ඒ කාලයේ විදිවල රඟ දැක් වූ නාට්‍ය පැවති බවට අදාල සාහිත්‍යයේ අනුමත සාධඛ පවතිනවා. විශේෂයෙන්ම දකුණු ඉන්දියාවේ වීදි නාට්‍ය රඟ දක්වා තිබෙනවා.

නමුත් ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය මුලාරම්බය 1966 එවකට විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ දළුගම මණ්ඩපයේ පැවති පළමු කලා උළෙලේ ජී.සේ. හත්තොටුවේගම සර්.ගේ කෙටි නාට්‍යාචිත පිවිසුමකින් බ එහි රඟ පෑ මා සමග එතුමා වරක් පවසා තිබෙනවා. එදා එහි පැවති ගීතමය සෞදර්යයට මහා සිසු කැළ අත්පොළසන් දෙමින් දැක් වූ උසස් ප්‍රතිචාරය එතුමාගේ විදි නාට්‍ය ගමනේ ඉදිරි විකාශනයට උපස්ථාම්භනයක් වුවා නොඅනුමානය. මට මතක් වෙනව එදානම් එහි කථිකාචාර්ය සෙල්වදොරේ ගේ විමල්කුමාර කොස්තා මුල්වරට රඟ පෑ විකාරරූපී නාට්‍ය සම්ප්‍රදායට ෑයත් ''ගොඩෝ එන්තං' නාට්‍ය මුල්වරට වේදිකා ගත කලේ.

**එම මුලාරම්භක කෙටි වීදිය නාට්‍ය පිවිසුමේ ගීයක කොටසක් ඔබ තුමාට මතකද?**

ඔව් මම ගායනා කර පෙන්වන්නම්.

කොබෙයි රෑලක් රංචු ගසා නගින්නේ...//
නිල් අහස හඹා යන පිළිහුඩුවා....//
වනයේ ගිරවා් හොට රතු කෙරුවා ...//
නොවෙයි රෑළක්

මේ අවස්ථාවේ මගේ මතකයට නැගෙනව උක්ත සංගීතමය රංගනයේ ප්‍රධාන චාරිතය ප්‍රවීන නළු හේමසිරි ලියනගේ සතු වූ බව.

**විදි නාට්‍යවලින් ආචාර්ය තුමා සමාජයට යම් පණිවිඩයක් දිමට උත්සාහ කලාද**
ඇත්තටම ඔව්.ජී.කේ.සර් ජාත්‍යන්තර මානවයේ එතුමා නව අධිරාජ්‍යවාදයට ඒ තුළ සැඟවී රට අගාධයට යොමු කරන දේශිය හා විදේශීය සංවිධාන හා බලවේග වලටත් දේශපාලන සමාජ ආර්ථික හා සංස්කෘතික සංස්ථාවල දුබල පැති වලට එම වීදි නාට්‍ය තුලින් නිර්දය ලෙස පහර එල්ල කලා. එතුමාම එවකට ඇතැම් පුවත්පත් ''වීදියේ සටන් කරුවා'' යනුවෙන් හැඳින් වූයේත් ඔහු කලා කරුවන් අතර නිර්භිත කලා ගුරු කෙනෙකු වූ නිසාය.

**ඔබ ඒ පිළිබඳ යම් විස්තරයක් කියන්න කැමතිද?**
ඇත්තෙන්ම ඔව්. එතුමා වර්ෂ 1938 නොවැම්බර් මස 29 වෙනි දින ගාල්ලේ කොරලවැල්ල ග්‍රාමයේ සොයුරු සොයුරියන් අට දෙනෙකුගෙන් සමන්විත පවුලක උපත ලබා ඇති බවත්, ඔහුගේ පියා කොළඹ නගර සභාවේ සේවය කළ වියතෙකු බවත්, ජි.කේ.සර් ගාල්ලේ රිච්මණ්ඩ් විදුහලේ සිත්සතර හදාරා වර්ෂ 1956 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ඉංග්‍රීසි ගෞරව උපාධි අපේක්ෂකයකු වශයෙන් ෂේක්පියර් විමර්ශනයක යෙදෙමින් පේරාදෙණිය සරසවියේ නිෂ්පාදන වූ සිංහල නාට්‍යයක ප්‍රථම වරට රඟපාන ලද නළුවාවීමේ ගෞරවය අන්තරගත් බව සටහන්ව ඇත.

**එතුමාගේ නාට්‍ය ක්ෂේත්‍රය පිළිබඳව තව දුරටත් පැවසුවහොත්**
එතුමා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ගෞරව උපාධිය ලබා වර්ෂ 1960 පමණ නැවතත් තමා උගත් උපාල වන ගාල්ලේ රිච්මණ්ඩ් විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සේවය කරමින් සිංහල හා ඉංග්‍රීසි පාසල් නාට්‍ය කීපයක් නිෂ්පාදනය කර රඟ දක්වා ඇත.

වර්ෂ 1961 දි පමණ රුසියානු මහා ගත්කරු ඇන'ටන් චොකෝෆෝගේ ''ප්‍රොපෝසල්'' නැමති නාට්‍ය ''මගුල් පරසථාව''නමින් නැවත එලිදක්වන ලද්දේ මෙතුමාය. වර්ෂ 1964 දි වන විට විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට බැදී සිටි ඔහු විවිධ කලා හා ක්‍රීඩා කටයුතුවල නිරත වන්නට විය.

**ඔබ ඔහුගේ ශාරීර භාෂාවෙන් මතු වූ පෞරුෂය ගොඩනැගූ ආකාරය අපූරුයි. මේ සමග ඔහුගේ ගති පැවැතුම් ගැන යමක් කීවොත්.**
''මිනිසාගේ තනතුරු බලතල වත්කම් ඉක් කළ පසු ඔහු තුළ සිටින්නේ සාමාන්‍ය මිනිසෙකු පමණි'' යන සුප්‍රසිද්ධ කියමනට අනුරූපීව ගාමිණී හත්තොටුවේගම ගුරු පියාණෝ තම ශේෂ වූ ආයු කාලය තුළ ඉහත සඳහන් අස්තිර චංචල සියළු ආභරණ පසෙක් ලා සාමාන්‍ය අව්‍යාජ මිනිසෙකු වහයෙන් තම ජීවිතය ගලායාමට ඉඩදීම ආශ්වයර්‍ය ජනකය වි බව ඔහුව සමීපව ඇසුරු කළ අප සමැ හොඳින් දැන සිටිය. ඹුහ සතු ධනය වූයේ අසාමාන්‍ය නව චිංතාවවනුත් භේදයකින් තොර සමාජ සිතිවිලිවල්ත සාමාජයෝගි බවත්, පොත්පත් පෑන්, පැන්සල් හා ඇඟළුම් කීපයක් සැබැදි අඩුම කුඩුම පුරවා ගත් ''හවා මල්ලක්'' ගමන් ගාස්තු වශයෙන් අවශ්‍ය වූ කාසි කිපයකුත් පමණි.

**ආචාර්ය හත්තොටුවේගම සරසවියේ විෂය බාහිර ක්‍රියාකාරකම් කම්හි කැපවීම විශේෂත්වය බව ඔබ පැවසුවා ඒ පිළිබඳ විස්තර කරන්න.**
එතුමා ක්‍රිකට් ක්‍රීඩාවට ඇල්මක් දැක්වූවෙන් ඉංග්‍රීසි අංශයේ කලත් සරසවි ක්‍රිකට් කණ්ඩායම් භාරකාර ආචාර්ය වරයා ලෙෂ ශ්‍රමයන් තබා සතු අල්ප ධනයක් වැය කළේ අසාමාන්‍ය ධන කුවේරයෙකු මෙන් නිර්ලෝභීවයි.

වර්ෂ 1966-1967 විදුලකර විදුදය සරසිව මහා ක්‍රිකට් ගැටුවේදි විදුහකර සරසවිය ලගා කරගත් ක්‍රීඩා සටන්කාමී ගෞරවයෙන් ප්‍රධාන දායකත්වය එතුමා සතු වන බව එහි කණ්ඩායම් සාමාජකයෙක් වශයෙන් මා පෞද්ගලික විශ්වාස කරනව.

වර්ෂ 1967 යාපනය විදුහල සමග කළ සුහද ක්‍රිකට් සටන ඩේලිනිවස් ටුරූපි ක්‍රිකට් තරංග සදා අමතක නොවේ. එම ගමනේදී යාපනය විදුහල් ආචාර්ය මණ්ඩලය හා මහා ශිෂ්‍ය සංගමය ආරාධානයේ එක් මනරම් රාත්‍රියක එහි ප්‍රධාන ශාලාවේදී මෙතුමා කළ නාට්‍ය පිළිබඳ විශේෂ දේශනය දෙමළ වියතැන්ගේ මවිතයට හා ආවස්වාදයට හේතු වූ බව දේශනය අවසානයේදී පෙරළා ලැබුණ මහා අත්පොලසන් නාදයෙන් පසක් විය. මේ වන විට සරසවි ක්‍රිකට් කණ්ඩායම ඉතා ශක්තිමත් වූයේ ආචාර්ය රෙන්ටන් ඩි. අල්විස්, මාහාචාර්ය, ලක්ෂමන් වටවල විවිල් පෙරේරා. එම්.එම්. සත්‍යාවාදී බී.එල්.එච්. පෙරේරා ෂෙල්ටන් යන අයගේ දායකත්වය නිසා බව මතක් කල යුතුමය.

**එතුමා චිත්‍රපටි කලාව පිළිබඳද අවධානය යොමුකර ඇති බව මෙම අසා තිබෙනව ඒ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.**
වර්ෂ 1960 දාකයේ ''පුවත්පත් කලා වේදි හා චිත්‍රපට විචාරකයන්ගේ සංගමයේ'' ප්‍රබල මුලාරම්භක සාමාජිකයන් වන තිස්ස අබේසේකර.'' නාමෙල් වීරමුණි සහ තවත් වියතුන්කීප දෙනෙක් අතර එහි මුලාරම්භක සභාපති වශයෙන් ගාමිණී හත්තොටුවේගම වියාතාණෝ එදා රීගල් සිනමා ශාලාවේදි සම්භාව්‍ය චිත්‍රපට උළෙලක් සංවිධානය කිරිම ලෙහෙසි පහුස කර්තවයක් නොවේ.

**ඓතිහාසික ප්‍රථම නාට්‍ය දැක්ම අනුරපුර නගරයේ රඟ දැක්වුනු බව මාගේ මතකයේ රැදී තිබෙනවා. ඒ පිළිබඳ මතක සටහන් අවදි කරන්න.**
මා වර්ෂ 1973 දී පමණ අනුරාධපුර ශාන්ත ජේසප් විදුහලේ සේවය කරන අවදියෙන් ජි.කේ. සර් පරාක්‍රම නිරිඇල්ලයන්ගේ කළමණාකාරිත්වයෙන් එච්.ඒ. පෙරේරා දිපානි සිල්වා. ගාමිණී හෙට්ටිආරච්චි, පියරත්න අධිකාරි සහ තවත් විශාල පිරිසකගේන සමන්විත විදි නාට්‍ය කණ්ඩායමකගේ සහභාගිත්වයෙන් පොසොන් පුන් පෝ දිනක සඳ එළියේ අනුරාධපුර හරිස්චන්ද්‍ර ක්‍රීඩා පිටියේ විදි නාට්‍ය සංදර්ශනය මුලාරම්භක විදි නට්‍ය සංදර්ශනය ලෙෂ ඉතිහාසයේ සනිටුහන් වී ඇත. එදා වේදිකා ගත වූ '' මිනිසෙකුට එල්ලිලා මැරෙන්න බැරිඳ' කපුටා සහ කේප්ු කැල්ල'' සහ තවත් ක්ෂණික නිර්මිත සුහසන කෙටි නාට්‍ය කණ්ඩ විවිධ වූ පොදු ජන ප්‍රේක්ෂක කැළ අතර අතිශය ජනාදරයට පත් විය.

**එතුමා අතින් ලියවුනු ලිපි ලේඛන පිළිබඳ**
මහාකවි විලියම් ශේක්ස්පියර් ගේ ''හැම්ලට්'' නාට්‍ය පරිවර්තනය අතර ජී.කේ.සර්ගේ පරිවර්තනය හොදම සිංහල පරිවර්තනයට බවට විචාරකයන්ගේ ප්‍රශංසාව හිමි වූයේ ඊට දායක වූ ලක්ෂමන් ප්‍රනාන්දු හා ඊ.ඒ.ජී. ෆොන්සේකා යන වියතුන් නිසා බව එතුමා පවසා තිබේ. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයේ වැදගත් සංසිද්ධානයක් පිළිබඳ මෙතුමා විසින් ඉංග්‍රීසි පුවත්පත් වලට සැපයූ ලිපි හා ගුවන් විදුලි සාකච්ඡා වියතුන් අතර ජනාදරයට පත්වුනා. ඔහුගේ ලිපි දේශන සාකච්චා බොහෝ දුරට සීමා වුයේ ව්‍යුක්ත ඉංග්‍රීසි බස හසුරුවන විද්‍යතුන්මය. එය පොදුජන සංස්කෘතියට ඇතුල නොවිම් විශාල අඩුපාඩු වක් වුනා.

කලාන්තරයක් තිස්සේ ගොඩ නැගුනු නාට්‍ය විෂ්‍යාත්තර ප්‍රතිභාව ජී.කේ. හත්තට්ටුවේගම වියනාගෙන් ලබා ගැනීමට විදේශ රටවල් පවා අපේක්ෂා කලා . එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1980 සිට ඕස්ට්‍රේලියාව, ජර්මනිය, නෝර්වේ, පිලිපීනය, තායිලන්තය, හා ඉන්දියාව වැනි රටවල් නාට්‍ය වැඩමුළු හා සංදර්ශන පැවැත්වීමෙන් තමාට මෙන්ම තම මව්වරුන්ටද අනපේක්ෂිත අතිමහත් කීර්තියක් ලඟා කර දුන්හ.

**එතුමාගේ විවාහ ජීවිතය පිළිබඳ**
වර්ෂ 1971 දී හොරණ ශ්‍රී පාල් විද්‍යාපීඨයේ පසෙක පිහිටි සුන්දර ගෙඅයනක පදිංචි වී සිටි හිටපු විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි අංශයේ ප්‍රධානී වියන් අරියරත්න මැතිතුමාගේ දියණිය වන යමුනා සමග විවාහ වුනා. මා විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා කාලේ මා කැටුව ගෙන ගිහින් තිබෙනවා. මට මතකයි යමුනා හුරුබුහුටි ළද බොළඳ තරුණියක්. ඒ කාලේ ඒ කියන්නේ අදට අවු 45 ට පෙර රෝහණ හා ගිහාන් කියල ඇයට අපුරු සොයුරන් දෙදෙනෙක් සිටියි. ඒ පවුලේ අය බොහොම අගංතුක ස්තකාර දන්නා අය. හත්ගමුවේගම පවුලට රජිත්, හා චමිදු යනුවෙන් පුතෙකුත් හා දියණියක ලැබුණා. කලක් යන විට මේ සිව් දෙනෙක් වීදි නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයා බවට නිරන්තරයෙන්ම පත්වී දිප ව්‍යාප්තව සැරිසැරුවා මට මතකයි.

විශ්ව කාලකරුවාට වීදිය මහා මන්දිරයේ වූ බව එම කලා පවුල අව්‍යාජව ප්‍රදර්ශනය කලා. පසු කලෙක් ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලැබූ මෙම දරුවන් පරිසරයේ අංශයේ ඉහල ස්ථිරවල සේවය කනරබව මා අසා තිබෙනවා.

**මෙතුමා නැවතත් පේරාදෙණිය සරසවියේ සේවය කලා සේද?**
මේ වර්ෂ 1974 මාහාචාර්ය හල්පේ මහතා පේරාදෙණිය සරසවියේ ඉංග්‍රීසි අංශයේ ප්‍රධානියාව සිටි අවදියේ හත්තොටුවේගම වියතාගේ ශක්තීන් හඳුනාගත් එතුමා මෙම සම්පත් පුද්ගලයාගෙන් ප්‍රයෝජනය වූවස් තම දෙපාර්තමේන්තුවේ ඉංග්‍රීසි අංශයේ කථිකාචාර්ය වරයකු ලෙෂ බදවා ගත්තා. ඒ අවදියේ එතුමා ''සනමා සෞදර්ය '' පිළිබඳ විශ්ව විද්‍යාල තුල මෙන්ම විවිධ පරිසරයන්හි සමාජ තලයන්හි දේශන වැඩ මුළු ඇරඹුව. මේ කලාපයේ පිංවත්ත දුම්රිය ස්ථානයේ ස්ථානාධිපතිගෙන් ලැබුණු නොමසුරු සහාය පිළිබඳ එතුමා සමග නිතර පවසා තියනවා.

**හත්තොටුවේගම ශූරීන් දියත් කළ නාට්‍ය පුහුණු වැඩමුළු හා එතුමාට ලැබු රාජ්‍ය සම්මාන යා ආචාර්ය උපාධිය පිළිබඳ විස්තරයක් කරන්න.**
වර්ෂ 1971 දී ප්‍රසිද්ධ නාට්‍ය ශිල්පියෙක් වන ධම්ම ජාගොඩයාණන් කොළඹ ''ලයනල් වෙන්ඩ්'' හා ශිල්ප ශාලිකාවේ ඇරඹූ ප්‍රයෝගික නාට්‍ය වැඩමුළු වල ප්‍රධාන සහායක සම්පත් පුද්ගලයකු වශයෙන් ජී.කේ. ගුරුතුමා උනන්දුවෙන් සහභාගි විය. එතුමාට සමිති වෙත පවා ගොස් නාට්‍ය වැඩ මුළු සංවිධානය කර තිබේ. පානදුර පිංවත්ත දුම්රිය ස්ථානයට රැස් වූ විවිධ වයස් කාණ්ඩවල තරාතිරම් වල පුද්ගලයන් හට ස්වෙච්ඡාවෙන්ම වැඩමුළු පැවැත්වීමෙන් එතුමා අපමණය අශ්වාදයක් ලැබු බව මා සමග පවසා ඇත. මුල්ම යුගයේ මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ ''මනවේ''නාට්‍යයේ මෙන් ඊබ රඟ පෑ බෙන් සිරිමාන්න එඩ්මන්...... මුලිසියා සමග අදාල විෂය කේෂ්ත්‍රයන් පිළිබඳ දීගී සාකච්ඡා වාද විවාද, පැමිණි බව ජසෙකින් ඉද ඊට සවත්දුන් මා ඊට හොදම ශවාසියයි.

ශ්‍රී ලංකා කලා සංගමයෙන් පැවත් වූ රාජ්‍ය නාට්‍ය උළෙලේදි විදි නාට්‍ය විෂය කේෂ්ත්‍රයට කළ සේවය වෙනුවෙන් මෙතුමාට රාජ්‍ය සම්මානයෙන් පුදනු ලැබීය. වර්ෂ 2007 දී ජාතික නාට්‍ය උළෙලේදී ගුරුවෘත්තිකයකු විචාරකයකු නාට්‍ය අධ්‍යක්ෂක වරයකු ලෙස කළ මහඟු සේවයට එතුමාව ගෞරව සම්මානයෙන් පුදනු ලැබීය.

විශ්ව විද්‍යාලයක සුවිශේෂි විද්‍යාර්ථයකු දස දහස් සංඛ්‍යාවක් ගෝලබාලයන් බිහි කළ ගුරුවරයකු පරිවර්තකයකු, අනුවර්තකයකු, නාට්‍ය වේදියකු, මාධ්‍ය වේදියකු අඩ සිය වසකටත් වඩා රටට ජාතියට එතුමාගේ කැපවීම වෙනුවෙන් කැලණිය විශ්වවිද්‍යාල විසින් පැවැත් වූ උපාධි ප්‍රදානෝත්සවයකදී දර්ශනය පිළිබඳ ගෞරව ආචාර්ය උපාධියෙන් පුදනු ලැබීම කොපමණ අගය කළ යුත්තක්ද, කෘතගුණ සැලකීමක්ද?

එතුමා සාර්තක මිනිසෙකුට වඩා වටිනා මිනිසෙකු වූ බව මාගේ හැගීමයි. ඔහු සමග සිටි ඇතැම් සමකාලීනයන් මෙන් උසස් තනතුරු හා තත්වයන් කරා හඹා යාමේ මානසික ආවේගයන් නොතිබූ මෙතුමා සාමන්‍ය මිනිසෙකුගේ දිවි පැවැත්ම අගය කළ මානව භක්තිකයකු විය. ඔහු සතු ධනය වූයේ මානව චිංතාවන්ය. එහි ඵලයක් වශයෙන් පසු ග්‍රහයකදී වේදිකා නාට්‍ය හා චිත්‍රපට වල දීප්තිමත් කරු බවට පත්වූ ගිල්පීන් රැසකගේ මුලාරම්භය එතුමා හා බැඳී ගුරු ශ්‍රාතිත්වයයි. එක්තරා මාධ්‍ය වේදියෙක් පැවසූ පරිදි ''විදිය වේදකාවත් කළේ'' ඔහුය තවත් අයෙක් ප්‍රකාශ කළේ '' ඔහු විදියේ සටන් කරුවා බවයි.

මුදල් ඉපයීම නාට්‍ය කලාවේ ප්‍රගමනයට ඇරුත්සන් වචනයක් බව ඔහුගේ පිළිගැනීම විය. ලදදෙයින් සතුටුවිම ඔහු සතු මානව ගුණයකි. එතුමා තව ටික කලක් ජීවත් වුවානම් මුළු මිහි තලයට වේදිකාවක් කිරිමට වෙරදරනු නොඅනු මානයි. ශ්‍රී ලංකා දිවීපයට විදි නාට්‍ය හදුන්වාදී එය සංස්කෘතික අංගයක් බවට පත් කළ අපේ ගුරුතුමාට නිවන් සුව අත්වේවා.

**සුනිල් අබේසේකර**
ආදි විද්‍යාර්ථී කැලණිය විශ්ව විද්‍යාලය
( වර්ෂ 1965-1970)
සාම විනිසුරු
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක